මගේ අංකය : D16/විභාග/534/2019
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ - 09.
2022.04.

සියලුම බන්ධනාගාර අධිකාරීන් සහ
සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත,

**<u>II පෙළ ජේලර්/II පෙළ පුනරුත්ථාපන නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය (නුහුරු භාෂාව) - 2021</u>**

II පෙළ ජේලර්/II පෙළ පුනරුත්ථාපන නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගයක් විභාග කොමසාරිස් ජනරාල් විසින් 2022 අගෝස්තු මාසයේදී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන II පෙළ ජේලර්/II පෙළ පුනරුත්ථාපන නිලධාරීන් ස්ථිර පත්වීමක් ලබා වසර තුනක් ඇතුළත පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගයට අදාළ නුහුරු භාෂා විභාගය සමත් විය යුතුය. ඒ අනුව අදාළ තනතුරේ ස්ථිර පත්වීමක් ලබා සිටින මෙතෙක් කඩඉම් සමත්ව නැති II පෙළ ජේලර්/II පෙළ පුනරුත්ථාපන නිලධාරීන්ට මෙම විභාගය සඳහා පෙනී සිටිය හැක.සිංහල භාෂාවෙන් රාජ්‍ය සේවයට බැඳුණු නිලධාරීන් නුහුරු භාෂාව ලෙස දෙමළ භාෂාව ද දෙමළ භාෂාවෙන් බැඳුණු නිලධාරීන් නුහුරු භාෂාව ලෙස සිංහල භාෂාවද සමත් විය යුතුය.

02. මෙයට අමුණා ඇති ආකෘති පත්‍රයට අනුකූලව සකස් කර ගන්නා ලද අයදුම්පත් සම්පූර්ණ කර පිටපත් දෙකකින් යුක්තව 2022.05.17 දිනට ප්‍රථම මා වෙත එවිය යුතුය. නියමිත ලෙස අයදුම්පත සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් සහ ප්‍රමාද වී ඉදිරිපත් කරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. පළමු වරට විභාගයට අයදුම් කරන නිලධාරීන් විභාග ගාස්තු ගෙවිය යුතු නොවේ. දෙවන හා ඉන් පසු වාරවල දී විභාගයට ඉදිරිපත් වන අයදුම්කරුවන් විභාග ගාස්තුව ලෙස රු.600/- ක මුදලක් විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 යටතේ රජයේ ආදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අපේක්ෂකයාගේ නමින් ලබාගන්නා ලදුපත, අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතුය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර, විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් නොකෙරේ. එසේම ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් විය හැක.

04. විභාගය පැවැත්වෙන්නේ සිංහල හා දෙමළ මාධ්‍යවලින් පමණක් වන අතර, ඉල්ලුම් කරනු ලබන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

05. අයදුම්පතේ අංක 01 සිට 06 තෙක් වූ ශීර්ෂ පළමුවන පිටුවටද, ඉතිරිය සෙසු පිටුවලටද ඇතුළත් වන පරිදි අයදුම්පත සකස් කළ යුතුය. අයදුම්පත විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන මාධ්‍යයෙන් නිලධාරියාගේ අත් අකුරින්ම සම්පූර්ණ කළ යුතුය. අයදුම්පතේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද යෙදිය යුතුය.

06. එසේම නිවේදනයේ ඇතුළත් ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින්, අයදුම්පත යොමු කිරීමට පෙර ඒ පිළිබඳව විමසිලිමත් වන ලෙස නිලධාරීන් දැනුවත් කරන්න.

07.විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මෙහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

08. විභාග විෂය නිර්දේශය:

| විෂය අංකය | ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|---|
| | නුහුරු භාෂාව (සිංහල/දෙමළ) | වාචික ප්‍රශ්න සහ ඡේදයන් පරිවර්තනය කිරීම | | 100% | 40% |

09. නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත.විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 02 ක් හෝ 03 ක් ගතවූ පසුවත් තම ප්‍රවේශ පත්‍ර නොලද අපේක්ෂකයකු වේ නම් ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය, හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම් එම විස්තරය සමඟ ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක්ද සඳහන් කළ ඉල්ලීම් ලිපියක්, දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා අයදුම්පතෙහි පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

10. විභාගය සඳහා පෙනී සිටින අවස්ථාවේදී විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

11. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

එච්.එම්.ටී.එන්.උපුල්දෙනිය
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

එච්.එම්.ටී.එන්. උපුල්දෙනිය
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

II පෙළ ජේලර්/II පෙළ පුනරුත්ථාපන නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය (නුහුරු භාෂාව) – 2021

1st Efficiency Bar Examination for the Posts of Class II Jailor/Class II Rehabilitation officer (Unfamiliar Language) - 2021

විභාග අංකය: [ ]
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

01) විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :- [ ] සිංහල - 2
දෙමළ - 3
(අදාළ අංකය කොටුව තුළ සඳහන් කරන්න)

02) 2:1 සම්පූර්ණ නම :- ..........................................................................................................

..........................................................................................................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරින් උදා :- HERATH MUDIYANSELAGE SARATH KUMARA HERATH )

2:2 අගට යෙදෙන නම මුලින්ද, අනෙකුත් නම්වල මුලකුරු පසුව යොදා නම :- ................................

..........................................................................................................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරින් උදා :- HERATH .H.M.S.K. )

2:3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :-.........................................................................

..........................................................................................................................

03) විභාග ප්‍රවේශ පත් තැපැල් කළ යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :-.............................................

..........................................................................................................................

04) ස්ත්‍රී/පුරුෂ භාවය :- [ ] පුරුෂ - 0
ස්ත්‍රී - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

05) ජාතික හැඳුනුම්පත් අංකය :- | | | | | | | | | | | | |

06) ජංගම දුරකථන අංකය :- | | | | | | | | | | |

07) II පෙළ ජේලර්/II පෙළ පුනරුත්ථාපන නිලධාරී ස්ථිර තනතුරට පත් වූ දිනය :

| D | D | M | M | Y | Y | Y | Y |
|---|---|---|---|---|---|---|---|

08) කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්විය යුතු දිනය හෝ වැටුප් පියවර :-

09) ඔබ විභාගයට පෙනී සිටින්නේ පළමු වතාවට ද/දෙවන වතාවට ද යන වග :-

10) මූලස්ථාන පෞද්ගලික ලිපිගොනු අංකය :-

11) විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :

i. විභාග ගාස්තු ගෙවූ තැපැල් කාර්යාලය/උප තැපැල් කාර්යාලය : ...........................................
ii. ලදුපත් අංකය හා දිනය : .............................................................................
iii. ගෙවූ මුදල : ..........................................................

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න

(ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක)

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉල්ලා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට යටත්වන බව ද ප්‍රකාශ කරමි.

...................................................
අයදුම්කරු/අයදුම්කාරියගේ අත්සන

දිනය : ............................

12) අත්සන සහතික කිරීම

මාගේ කාර්යාලයේ නිලධාරියකු/නිලධාරිනියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ..........................................................................මහතා/මහත්මිය/මෙනෙවිය .......................... දින මා ඉදිරිපිටදී අත්සන් කළ බවත්,නියමිත විභාග ගාස්තුවෙන් නිදහස් බවත්/නියමිත විභාග ගාස්තුව ගෙවා එම ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

දිනය : ..........................

..........................................................
සහතික කරන නිලධාරියාගේ අත්සන

සහතික කරන නිලධාරියාගේ නම :
තනතුර :
ලිපිනය :
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

13) දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය
ඉහත අංක 01 සිට 11 තෙක් අඩංගු තොරතුරු නිවැරදි බවත් මෙම අයදුම්කරුට/අයදුම්කාරියට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, ඔහු/ඇය විසින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

...........................................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා පදවි නාමය
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

දිනය : .....................